# සාමාන්‍ය සමයේ විසිපස්වන සතිය
# සඳුදා

## පළමුවන කියැවීම

එස්රාගේ පොතෙන් ගත් පාඨයෙකි.

එස්රා 1 : 1–6

"ස්වාමින් වහන්සේගේ මාළිගාව ගොඩ නඟන්නට දේව ජනතාව ජෙරුසලමට ගියහ."

පර්සියාවේ රජ වූ සයිරස්ගේ පළමුවන අවුරුද්දේ දී, සමිඳාණන් වහන්සේ ජෙරමියා මගින් ප්‍රකාශ කළ වචනය ඉටුවන පිණිස, උන් වහන්සේ පර්සියාවේ රජ වූ සයිරස්ගේ සිත උද්‍යෝගවත් කළ සේක. ඔහු තමාගේ රාජ්‍යයේ සතර දිග් භාගයෙහි ප්‍රසිද්ධියේ කියවන පිණිස ප්‍රකාශනයක් නිකුත් කළේය. එය මෙසේ ය.
"පර්සියාවේ රජු වන සයිරස් තෙමේ මෙසේ කියයි. 'ස්වර්ගයෙහි දෙවි සමිඳාණන් වහන්සේ පොළෝ තලයෙහි සියලු රාජ්‍යයන් මට දී තිබේ. තවද, උන් වහන්සේ ජුදාහී ඇති ජෙරුසලම් නගරයෙහි උන් වහන්සේට මාළිගාවක් ගොඩ නඟන්නට මට අණ කර තිබේ. උන් වහන්සේගේ මුළු සෙනඟගෙන් ඔබ අතරේ සිටින කවර මිනිසෙක් හෝ වේවා, දෙවි සමිඳාණන් වහන්සේ ඔහු සමඟ වැඩ සිටින සේක්වා! ඔහු ජුදාහි ඇති ජෙරුසලමෙහි සිටින ඉශ්රායෙල්වරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේගේ මාළිගාව ගොඩ නඟන්නට ජෙරුසලමට යා යුතුය. උන් වහන්සේ වූ කලී, ජෙරුසලමෙහි වැඩ සිටින දෙවියන් වහන්සේ ය. යම් ජුදෙව්වෙක් ඉතිරි ව යම් තැනක සිටී ද, ඒ ස්ථානයේ සිටින මනුෂ්‍යයෝ ජෙරුසලමේ තිබෙන දෙවියන් වහන්සේගේ මාළිගාව උදෙසා සිය

කැමැත්තෙන් දෙන පඬුර හැර, රන් රිදී ද බඩුබාහිරාදිය හා ගව මහීෂයන් ද දෙමින් ඔහුට උපකාර කරත්වා!”.

ජෙරුසලමෙහි සමිඳාණන් වහන්සේගේ මාලිගාව ගොඩ නගන පිණිස, දෙවියන් වහන්සේ විසින් සිත් උද්‍යෝගවත් කරවන ලද සියලු දෙනා ම එනම්, ජුදෙව්වරුන්ගේත්, බෙන්ජමින්වරුන්ගේත් පිය වංශවල ප්‍රධානීහු ද පූජකයෝ ද ලෙව්වරු ද එහි යන්නට සූදානම් වූහ. ඔවුන් අවට සිටි සියල්ලෝ ද සිය කැමැත්තෙන් දුන් නානා විධ පඬුරුවලට අමතරව රිදී භාණ්ඩ ද රන් ද බඩු බාහිරාදිය ද ගව මහීෂයන් ද අනර්ඝ දේවල් ද යන මේවායින් ඔවුන්ට උපකාර කළහ.

දේව වචනය මෙසේ ය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 126 : 1 – 6

පිළිතුර: සමිඳාණෝ අප උදෙසා ඉමහත් දේ කළ සේක.

ගීය:

සමිඳුන් අප මුදා සියොනට ගෙනා කල, අපට එය සිහිනයක් මෙන් විය. එවිට අපි සිනාවෙන් ඉපිලී ගියෙමු. ප්‍රීතියෙන් ගී ගායනා කළෙමු.

"සමිඳාණෝ මොවුන් උදෙසා ඉමහත් දේ කළ සේකැ"යි විජාතීහු කියන්නට ගත්හ. සමිඳාණෝ අප උදෙසා ඉමහත් දේ කළ සේක. එබැවින් සන්තෝෂ වමු.

සමිඳුනි, අපේ සිරකරුවන් දකුණු දිශාවේ ගලා යන ඇළදොළ මෙන් අපට යළි ගෙන දුන මැනව. දුකින් කෙත වපුරන්නෝ තුටින් අස්වැන්න නෙළා ගන්නෝ ය.

ඔව්හු වී මලු රැගෙන කඳුළු සල සලා පිටත් ව ගිය නමුත් තම ගොයම් මිටි රැගෙන ප්‍රීතියෙන් පින පිනා ආපසු ආහ.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
දෙවියන් වහන්සේ මැවූ සත්ත්වයන් අතර අප මුදුන් මල්කඩ වීමේ පෙර ලකුණු වශයෙන් සිය අරමුණු අනුව උන්වහන්සේ සත්‍ය වචනයෙන් අප ජනිත කළ සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
මිනිසුන් ඔබේ යහපත් ක්‍රියා දැක, ස්වර්ගයෙහි වැඩ වසන ඔබේ පියාණන් වහන්සේට ප්‍රශංසා කරන පිණිස ඔබේ ආලෝකය ඔවුන් ඉදිරියෙහි බබළවන්න.
ආලේලූයා!

# සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 8: 16-18

"පහනක් දල්වා සියල්ලන්ට එළිය පෙනෙන පිණිස පහන් රුකක් මත තබති."

"කිසිවෙකු පහනක් දල්වා බඳුනකින් වහන්නේ වත් යහනක් යට තබන්නේ වත් නැත. එහෙත් ඇතුල් වන්නන්ට එළිය පෙනෙන පිණිස පහන් රුක උඩ තබති. ඒ නිසා හෙළි කරනු නොලබන සැඟවුණු දෙයක් නැත. නොහොත් ප්‍රකාශයට පත් නොවන, හෙළි නොවන, කිසි රහසක් ද නැත. එබැවින් ඔබ සවන් දෙන්නේ කෙසේදැයි විමසිල්ලෙන් සිටින්න. මන්ද, යමක් ඇති තැනැත්තාට දෙනු ලැබේ. යමක් නැති තැනැත්තාගෙන් තමාට ඇතැයි සිතන දෙය පවා පැහැර ගනු ලැබේ."

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.